**මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය සභාව - 2023**
**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ උප වගන්තිය 172(1) සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවු කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ වවුචර්වල වටිනාකම රු.14,000,000ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරි කාලයේදී කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දැක්විය යුතුය. |
| (ආ) | 2022 වර්ෂයේ පුස්තකාල 07ක් සඳහා පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ පොත් 2450ක වටිනාකම රු.558,170ක් සහ සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ මිල සඳහන් නොවූ පොත් 158ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේදී මෙම දෝෂය නිවැරදි කරන බව. | පරිත්‍යාග ලද පුස්තකාල පොත්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දැක්විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ ලෙනෝවා ටෙප් එකක් සහ ලීටර් 500ක් පමණවූ ජල ටැංකි 08ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | -එම- | පරිත්‍යාග ලද වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.21,076,222ක් වටිනා ගිණුම් ශේෂ 04 කට අදාල ස්ථාවර වත්කම් ලේඛනය, හිමිකාරිත්වය සනාථ කිරීම් ලේඛන, අත්තිකාරම් ලේඛනය සහ අනෙකුත් ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වත්කම්වලට අදාල ලේඛන නඩත්තු කර, අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වත්කම්වලට අදාල ලිඛිත සාක්ෂි ලබාගැනීමටත් ලේඛනවල ලේඛනගත කිරීමටත් කටයුතු කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 371(2)(ආ) | පසුගිය වර්ෂයන්හිදි සභාවේ සන අපද්‍රව්‍ය සම්බන්ධව ලබාදුන් එකතුව රු.2>914>548ක අත්තිකාරම් ගෙවීම් 41ක් හඳුනාගෙන නිරවුල් කිරීමට වර්ෂ 05කට අධික කාලයක සිට පියවර ගෙන නොතිබුණි. | ඊළඟ වර්ෂයේ ඒවා හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 571(1), (2) හා (3) | වර්ෂ 02කට වඩා වැඩි රු.13,581,977ක කල් ඉකුත් වූ තැන්පතු 22ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. | වර්ෂ 02කට වඩා වැඩි කල් ඉකුත් වූ තැන්පතු අදාල පුද්ගලයින්ට ආපසු ලබාදීමට හෝ සභාවේ ආදායමට මාරු කිරීමට කටයුතු කරන බව. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු.12,972,615ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 19,429,389 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස් කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 722,425 | 722,425 | 514,100 | 208,325 | - | - | - | - |
| කුලී | 4,004,000 | 7,454,953 | 7,316,950 | 138,003 | 4,184,600 | 4,218,452 | 40,080,450 | 138,002 |
| බලපත්‍ර ගාස්තු | 1,213,000 | 2,683,892 | 1,471,532 | 1,212,360 | 1,189,000 | 2,426,754 | 1,214,394 | 1,212,360 |
| වෙනත් ආදායම් | 4,012,500 | 4,544,581 | 3,939,059 | 605,522 | 16,223,000 | 32,315,740 | 32,769,093 | 374,952 |
| **එකතුව** | 9,951,925 | 15,405,851 | 13,241,641 | 2,164,210 | 21,596,600 | 38,960,946 | 74,063,937 | 1,725,314 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ පරිපාලන බලප්‍රදේශයේ පිහිටි ගම්මාන 08කින් අයවිය යුතු රු.69,415ක වරිපනම් හා බදු අයකිරිමට පියවර ගෙන නොතිබුණි. | ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ හිටි ආදායම් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ලෝක දෘෂ්‍ය සංවිධානය (World Vision) විසින් ස්ථාපිත කළ කරෙයාකන්තීවු පානීය ජලය බෙදාහැරීමේ ව්‍යාපෘතිය යටතේ සභාව විසින් ජලය සැපයීම වෙනුවෙන් පුද්ගලයින් 207කගෙන් අයවිය යුතු ජල ගාස්තු රු.1,569,062ක් අයකර නොතිබුණි. | එම ගම්මාන ජනතාවගේ උනන්දුවක් නොමැතිවීම හා එම ගමට අදාල ප්‍රජා මූල මධ්‍යස්ථානයේ අකාර්යක්ෂමතාව හේතුවෙන් විශාල මුදලක් අය නොවී හිඟහිටිව පවතින බව. | -එම- |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන දක්වා අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරමින් පැවැති හඳුනා නොගත් ණය හිමියෙකුට ගෙවිය යුතු රු.1,873,377ක මුදලක් අදාල ණය හිමියා හඳුනාගෙන නිරවුල් කිරීමට හෝ සභාවේ ආදායමට මාරුකිරීමට පියවර ගෙන නොතිබුණි. | තොරතුරු සම්බන්ධයෙන් ලේඛන කිසිවත් නොමැති බැවින් මෙම මුදල නිසි අයුරින් ගැලපීම් කිරීමට නොහැකි වී ඇති බව. | ණය හිමියන් වෙත ගෙවිය යුතු මුදල නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභා වේ පුරවැසි ප්‍රඥප්තිය (Citizen Charter) ප්‍රකාරව, දින 14ක් තුළ ගොඩනැගිලි අනුමැතීන් ලබාදිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ ගොඩනැගිලි අයදුම්පත් 44කින් 15ක් සඳහා පමණක් අනුමැතිය ලබාදී තිබුණි. එසේම, අනෙකුත් අයදුම්පත්‍ර 29කින් ගොඩනැගිලි 08ක් සඳහා වූ අනුමැතීන් මාස 03 ක සිට 07ක් දක්වා වූ කාල ප්‍රමාදයකින් පසුව අනුමැතිය ලබාදීම් සිදුකර තිබුණි. | ඉදිරියේදී ගොඩනැගිලි අයදුම්පත්‍ර සඳහා දින 14ක් ඇතුළත අනුමැතින් ලබාදීමට පියවර ගනු ලබන බව. | ගොඩනැගිලි අනුමැතින් නියමිත කාලවකවානු තුළ ලබාදීමට පියවර ගත යුතුය. |
| (ඇ) | 2003 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන දක්වා රු. 120,940ක පොලී ආදායමක් ලබාදුන් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමේ පැවැති රු.500,000ක් වර්ෂ 19ක සිට ස්ථාවර තැන්පතු ගිණුම්වල තැන්පතු කිරීමට පියවර ගැනීමට සභාව විසින් අපොහොසත් වීමෙන් ආසන්න වශයෙන් රු.1,375,000ක පොලී ආදායමක් අහිමි වී තිබුණි. | 2024 මූල්‍ය වර්ෂයේ මෙම මුදල ස්ථාවර තැන්පතු ගිණුමක තැන්පත් කිරීමට පියවර ගනු ලබන බව. | දීර්ඝ කාලයක සිට ඉතිරි කිරීමේ ගිණුමේ තිබූ මුදල් ස්ථාවර තැන්පතු ගිණුමක තැන්පත් කිරීමට පියවර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව, නිශ්චල දේපළෙහි වාර්ෂික වටිනාකම මත වරිපනම් හා බදු අයකළ යුතු වුවත්, සභාවේ පරිපාලන බලප්‍රදේශයේ ගම්මාන 08ක පිහිටි නිශ්චල දේපළ 6,425ක් සඳහා වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු නොකර සභාවේ තාවකාලික තක්සේරුවක් මත වරිපනම් බදු අයකිරිම සිදුකර තිබුණි. | බදු අයකිරීම්, තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රමාදය හේතුවෙන් සභාව විසින් තාවකාලික තක්සේරුවක් මත දේපළ මත බදුකිරිම සිදුකළ බව | නිශ්චල දේපළෙහි වාර්ෂික වටිනාකම මත වරිපනම් හා බදු අයකළ යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් භාවිතා කරනු ලබන හෙක්ටයාර 63.7ක වපසරියකින් යුතු ඉඩම් 75ක් පවරා ගැනීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි. | මෙම ඉඩම්වලට හිමිකම් ඉල්ලීම් කර පළාත් පාලන කොමසාරිස්වරයා මාර්ගයෙන් ප්‍රා දේශීය ලේකම්වරයා වෙත අයදුම්කර ඇති බව. | සභාව සතු ඉඩම්වල අයිතිය නිරවුල් කරගත යුතුය. |
| (ආ) | සභාව සතු ට්‍රැක්ටර් 05ක්, ට්‍රේලර් 02ක්, බවුසර් සහ ගල් රෝල ආදිය දීර්ඝකාලයක සිට අක්‍රියව පැවැති අතර ඒවා අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ වෙන්දේසියේ විකිණීමට වර්ෂ 10කට අධික කාලයක සිට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | වාහන වෙන්දේසියේ විකිණීම සඳහා වූ අනුමැතීන් මේ දක්වා ලබානොදීම නිසා එවා සභාවෙන් අපහරණය කිරීමට නොහැකිව පවතින බව. | වාහන අළුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ අභාවිත ඒවා අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වෙනත් රජයේ ආයතනවලින් පරිත්‍යාග වශයෙන් සභාවට ලැබුණු වාහන, ට්‍රේලර් සහ බවුසර් ඇතුළු වාහන 21ක් සභාව විසින් පරිහරණය කර තිබූ නමුත්, ඒවා සභාවට පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | වාහන සඳහා පවරා ගැනිමේ කටයුතු සිදුකර එම ඉල්ලීම් අදාල දෙපාර්තමේන්තු වෙත යවා ඇති බව. | සභාව සතු වාහනවල අයිතිය නිරවුල් කරගත යුතුය. |
| (ඈ) | 2022 වර්ෂයේ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ආණ්ඩුකාර අරමුදලින් මිලදී ගත් රු.289,250ක මල්ටි චොපර් යන්ත්‍රය (Multi Chopper Machine) භාවිතා කිරීමට වර්ෂ 02කට අධික කාලයක් පියවර ගෙන නොතිබුණි. | මෙම වර්ෂයේ එම යන්ත්‍රය උපයෝජනය කර පොහොර නිෂ්පාදන කටයුතු සිදුකරන බව. | කාබනික පොහොර නිෂ්පාදනය සඳහා මිලදීගත් මල්ටි චොපර් යන්ත්‍රය භාවිතා කිරීමට පියවර ගතයුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ ප්‍රථමික මට්ටමේ පුරප්පාඩු 12ක්ද, ද්විතියික මට්ටමේ තනතුරු පුරප්පාඩු 04ක් වශයෙන් තනතුරු 16ක් පුරප්පාඩුවී පැවැතීමෙන් සභාව විසින් මහජනතාවට ලබාදෙන සේවාවන් දුර්වල තත්ත්වයක පැවැතුණි. | රටෙහි පැවැති අර්බුදකාරි වාතාවරණය හේතුවෙන් පුරප්පාඩු සම්පූර්ණ කර නොපවතින බව. | පුරප්පාඩු පිරවීමට සුදුසු ක්‍රියාමර්ග ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1988 අංක 56 දරන පනතෙන් සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ ක්‍රියාත්මක වන රෙගුලාසිවලට අනුකූලව ව්‍යාපාරික ආයතන 03ක් විසින් කල් ඉකුත් වූ පාරිසරික බලපත්‍ර අළුත්කිරීමට පියවර ගෙන නොතිබුණි. එසේම, ඉහත පනතේ පනෙත් රෙගුලාසි සහ 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන විශේෂ ගැසට් පත්‍රයේ "ආ" වගන්තිය ප්‍රකාරව ව්‍යාපාරික ආයතන 23ක් සහ අරසඩිච්චේනෙයි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය විසින් පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබුණි. | පරිසර ආරක්ෂක බලපත්‍ර ලබාගැනීමට සහ අළුත්කිරිමට කටයුතු කරන බව. | ව්‍යාපාරික ආයතන පරිසර ආරක්ෂක බලපත්‍ර අළුත්කිරිමටත්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පරිසර ආරක්ෂක බලපත්‍ර ලබා ගැනීමටත් කටයුතු කළ යුතු වේ. |